උඩපළාත ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට උඩපළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමේ දී, රු.283,870,671 ක අගයක් සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී, නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පොදු ගබඩා මිල දී ගැනීම් රු.1,691,850 ක් වැය විෂයන්ට බැර කිරීම හේතුවෙන්, වියදම අඩුවෙන් පෙන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | එකී දෝෂය ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ලැබීම් රු.128,851 ක් අඩුවෙන් ගලපා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී, නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | වර්ෂය අවසානයට ලැබිය යුතු රු.2,278,777 ක දැන්වීම් පුවරු ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ආයතන 10 කට මේ වන විට නඩු පවරා ඇති අතර, සියලුම හිඟ ගාස්තු අය කිරීමට කටයුතු කරමි. |

1.3.2 <u>නොසැසඳුණු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව, ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම හා උපයෝගී ලේඛන අනුව, එම වටිනාකම අතර රු.1,000,000 ක නොසැසඳීමක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සඳහා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවුරුදු 05 ක කාලය ඉක්ම වූ ලැබිය යුතු ශේෂය රු.4,240,218 ක් විය. | ලැබිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අවුරුදු 05 ට වැඩි කඩ කුලී හිඟ කපා හැරීමට විෂය භාර අමාත්‍යවරයාගෙන් ඉල්ලීම් කළ ද, එය නොහැකි බව දන්වා ඇත. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| | | |
|---|---|---|
| අවුරුදු 05 ක කාලය ඉක්ම වූ කර්මාන්ත ණයහිමි ශේෂය රු.956,810 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අවුරුදු 01 ත් 05 ත් අතර ශේෂවලට අදාළ අත රැඳවුම් මුදල් පිළිබඳ දැනුවත් කර ලිපි යවා ඇත. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලේඛන හා ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.606,610 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

1.4 අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158(අ)(ආ) | ගෙවීම් පැහැර හැරි තැනැත්තන්ගේ චංචල හෝ නිශ්චල සියලු දේපළ තහනමට ගෙන එකී හිඟ ගාස්තු අය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභා පනතට අනුකූලව ක්‍රියා කළ යුතු වේ. | ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, එහි දී ගෙවීම් පැහැර හරින්නන්ගේ දේපළ තහනම් කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 104(4) | 2010 වර්ෂයේ අනතුරට පත් වාහනයක් සම්බන්ධව 2018 දෙසැම්බර් මස දක්වාම පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මු.රෙ.104 පරීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| (i) | 218 රීතිය | වාර්ෂිකව සියලු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | මූල්‍ය හා පරිපාලන රීති මාලාවට අනුකූලව ක්‍රියා කළ යුතු වේ. | 2019 වර්ෂයේ සිට ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් කිරීමට කටයුතු කරමි. |
| (ii) | මූල්‍ය රීති 59 හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) – 152 වගන්තිය | බල ප්‍රදේශයේ පවතින කර්මාන්ත/ වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | මූල්‍ය හා පරිපාලන රීති මාලාවට අනුකූලව ක්‍රියා කළ යුතු වේ. | බලපත්‍ර සමීක්ෂණය මේ වන විට සිදු කරමින් පවතී. |
| (ඉ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | වසර 05 කට වරක් සිදු කළ යුතු වරිපනම් තක්සේරුව 2005 වර්ෂයෙන් පසු සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ අනුකූලව ක්‍රියා කළ යුතු වේ. | නව තක්සේරුවක් ලබා දීමට තක්සේරු දෙපාර්තමේන්තුව කටයුතු කර නොමැත. |
| (ඊ) | 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ක් වූ ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දිය යුතු කර්මාන්ත 12 ක් වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | චක්‍රලේඛ අනුකූලව ක්‍රියා කළ යුතු වේ. | පරිසර බලපත්‍ර සමීක්ෂණය 2018 වර්ෂයේ සිදු කර ඇත. |

1.5 <u>ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තියට අනුකූල නොවන පරිදි කර්මාන්ත 03 ක ණයගැති වටිනාකම රු.150,360 ක් සහ රු.10,000,000 ක මුද්දර ගාස්තු වටිනාකමක් ගිණුම්වලින් කපා හැර තිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තියට අනුකූලව ක්‍රියා කළ යුතු වේ. | මෙවැනි අඩුපාඩු නැවත සිදු නොවීමට වගබලා ගන්නා බව දැනුම් දෙමි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,455,620 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.67,801,354 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,117,000 | 2,917,135 | 2,992,084 | 2,405,485 | 3,534,000 | 1,969,320 | 2,009,921 | 4,414,656 |
| (ii) | කුලී | 3,703,200 | 3,647,760 | 3,203,395 | 2,177,225 | 2,935,000 | 1,986,504 | 1,929,696 | 774,983 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,955,100 | 1,856,875 | 1,687,675 | -- | 2,000,150 | 1,629,090 | 1,629,090 | -- |
| (iv) | වෙනත් ආදායම් | 37,857,500 | 32,685,098 | 12,686,564 | 53,268,554 | 27,400,000 | 60,325,325 | 41,098,472 | 41,784,343 |
| | එකතුව | 49,632,800 | 41,106,868 | 20,569,718 | 57,851,264 | 35,869,150 | 65,910,239 | 46,667,179 | 46,973,982 |

#### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| (i) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති හිඟය හා වර්ෂයේ බිල් කරන ලද රු.3,407,363 ක් වූ මුළු මුදලින් රු.2,091,010 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතු වේ. | ජංගම සේවා හා දේපළ තහනම් කිරීම මඟින් ප්‍රදේශ දෙකෙහිම හිඟ මුදල් රැස් කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව දැනුම් දෙමි. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ට වැඩි කාලයක් හිඟව පවතින ශේෂය රු.817,489 ක් වී තිබුණි. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජංගම සේවා හා දේපළ තහනම් කිරීම මඟින් ප්‍රදේශ දෙකෙහිම හිඟ මුදල් රැස් කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | ජල බදු | | |
| | බල ප්‍රදේශයේ උප කාර්යාලවල ඒකක 240 කින් 2005 වර්ෂයේ සිට හිඟ හිට තිබූ රු.82,145 ක ජල ගාස්තු ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතු වේ. | උප කාර්යාල බල ප්‍රදේශයේ පවතින හිඟ ජල ගාස්තු අය කිරීමට ඉදිරියේ දී කටයුතු කරමි. |

#### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ දී, දීර්ඝ කාලීනව බදු ලබා දී තිබූ පුස්සැල්ලාව පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 11 කින් අය විය යුතු රු.139,500 ක මුදල හා තාවකාලික කඩවල පදිංචි වෙළඳුන්ගෙන් අය කළ | හිඟ ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතු වේ. | හිඟ අය කර ගැනීමට ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදු කරන අතර, ජංගම වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතින බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | යුතු රු.1,329,654 ක කඩ කුලී අය කර නොතිබුණි. | | |
| (ආ) | බල ප්‍රදේශයේ පුද්ගලයින් 63 දෙනෙකුගෙන් හා කඩ කාමර 05 කින් අය විය යුතු රු.420,715 ක් වර්ෂ 06 කට අධික කාලයක සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම හිඟය කපා හරින ලෙස ඉල්ලීමක් කර, සාධාරණීකරණ වාර්තාවක් විෂයභාර අමාත්‍යවරයාට යොමු කළ අතර, එය ඉටු කළ නොහැකි බවට දන්වා ඇත. |

2.2.4 <u>බලපත්‍ර ගාස්තු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ---------------------------------- |
| (අ) | බල ප්‍රදේශයේ ගෝඝාතකාගාරයක් බදු ගත් පාර්ශවය විසින් වෙළඳ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෙළඳ බලපත්‍ර ලබා දීම ක්‍රමානුකූලව සිදු කළ යුතු වේ. | 2019 වර්ෂයට වෙළඳ බලපත්‍ර ලබා දීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2017 වර්ෂයේ සමීක්ෂණ වාර්තාවට අනුව, බල ප්‍රදේශයේ වර්ග අඩි 26,156 කින් යුත් දැන්වීම් පුවරු 355 ක් හඳුනා ගෙන තිබූ නමුත්, ඒවා ලේඛනගත කර නොතිබුණි. | සියලු ආදායම් සඳහා ලේඛන නඩත්තු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී, ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කරමි. |

2.2.5 <u>වෙනත් ආදායම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ----------------------------------- |
| (අ) | ජල යෝජනා ක්‍රම 07 කින් වර්ෂ ගණනාවක සිට අය විය යුතු රු.816,000 ක ජල ගාස්තු අය කර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම අක්‍රීය ජල යෝජනා ක්‍රම 07 හි හිඟ මුදල සම්බන්ධයෙන් මහා සභාවට යොමු කර තීරණයක් ගැනීමට නියමිතය. |
| (ආ) | ක්‍රියාකාරී තත්ත්වයේ පැවති ජල යෝජනා ක්‍රම 14 කින් අය විය යුතු රු.1,239,000 ක ජල ගාස්තු දීර්ඝ කාලයක සිට හිඟව පැවතුණි. | හිඟ ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සියලුම හිඟ මුදල් ඉදිරියේ දී අය කිරීමට කටයුතු කරමි. |

2.2.6 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ------------------------------ |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.1,050,224 ක් හා මුද්දර ගාස්තු රු.52,218,330 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අය වීමට ඇති උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්යසාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

<u>කර්තව්‍යයන් ඉටු නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය යෝජනා තුළින් අනුමත කර ගෙන තිබූ රු.5,000,000 ක් වටිනා යෝජනා 03 ක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ කාල පරිච්ඡේදය තුළ යෝජනා ක්‍රියාත්මක කළ යුතු වේ. | පසුගිය වර්ෂයේ ඉටු කිරීමට නොහැකි වූ එම යෝජනා මෙම වර්ෂයේ දී, ඉටු කිරීමට කටයුතු කරමි. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ අයවැය ලේඛනයට අනුව, ප්‍රජාමූල සංවිධානවල අවශ්‍යතා මත සහා අරමුදලින් මාර්ග 36 ක් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, ඉන් කර්මාන්ත 31 ක කටයුතු සිදු කර නොතිබුණි. | අයවැය ලේඛනවලට අනුව, සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රජා මූල සංවිධාන යෝජනා 36 න් 05 ක් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කර ඇත. |
| (ආ) | 2014 වර්ෂයේ රු.425,659 ක් වැය කර ඉදිකර තිබූ පෙරටු කාර්යාල ගොඩනැගිල්ල අදාළ අරමුණ සඳහා භාවිතා කර නොතිබුණි. | අරමුණුගත කාර්යය සඳහා ගොඩනැගිලි යොදා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම වර්ෂය අවසන් වීමට පෙර පෙරටු කාර්යාලයෙන් ඉටු විය යුතු සේවාවන් මහජනතාවට ලබා දීමට කටයුතු කරමි. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 30 ක පුරප්පාඩු පැවතුණි. | තනතුරුවල පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |

3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පැවති ප්‍රජා ජල ව්‍යාපෘති 19 ක හා සභා ජල ව්‍යාපෘති 14 ක ජල සාම්පල් පරීක්ෂාවක් කර බීමට සුදුසු බවට තහවුරු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතට අනුව, ජල සාම්පල් පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතු වේ. | ජල සාම්පල් පරීක්ෂාවක් සිදු කර ගැනීමට උපදෙස් ලබා දී ඇත. |

3.5 <u>වත්කම් කළමනාකරණය</u>

3.5.1 <u>වත්කම් ලේඛනගත නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ලී බඩු හා සවි කිරීම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොතිබුණි. | සභාව සතු ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ලේඛන නඩත්තු කළ යුතු වේ. | 2019 වර්ෂයේ සිට පවත්වා ගැනීමට කටයුතු කරමි. |

3.5.2 <u>වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාවට පවරා නොගත් රජයේ නිවාස 03 කින් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.315,695 ක හිඟ කුලී ද අය කර නොතිබුණි. | සභාව සතු වත්කම් සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවට පවරා ගැනීමට කටයුතු කළ පසු සියලු අය කිරීම් නීත්‍යානුකූලව ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | පුස්සැල්ලාව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 14 කින් 2017 හා 2018 වර්ෂ සඳහා කිසිදු කඩ කුලී මුදලක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | සභාව සතු වත්කම්වලින් ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අධිකරණයේ නඩුවක් විභාග වන බැවින්, වර්ෂ කිහිපයක සිට එම කුලිය අහිමි වී ඇති බව දන්වා ඇත. |

3.5.3 <u>පවරා නොගත් වත්කම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතුව පවතින සුසාන භූමි 37 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතුව පවතින වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සුසාන භූමි පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව සතුව පවතින ඉඩම් හා ගොඩනැගිලි 89 ක් සම්බන්ධයෙන් ඔප්පු හෝ පැවරුම් නියෝග නොතිබුණි. | නීත්‍යානුකූල අයිතිය සඳහා ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා ගත යුතු වේ. | ඔප්පු ලබා ගැනීමට කඩිනමින් කටයුතු කරමි. |

3.5.4 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ට්‍රැක්ටර් හා ට්‍රේලර් 05 ක්, යතුරු පැදියක් හා ක්‍රෲ කැබ් රථයක් මාස 08 ත් වර්ෂ 10 ත් අතර කාල පරිච්ඡේදයක් තුළ නිෂ්ක්‍රීයව පැවතුණි. | සභාව සතු වත්කම් නිෂ්ක්‍රීයව විනාශ වීමට ඉඩ නොතැබිය යුතු වේ. | අලුත්වැඩියා කිරීමට, වෙන්දේසි කිරීමට හා ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | රු.4,420,000 ක් වටිනා ගොඩනැගිලි 02 ක් වර්ෂ 03 කට අධික කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. | සභාව සතු ගොඩනැගිලි ඵලදායී ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඵලදායී අයුරින් යොදා ගැනීමට ඉදිරියේ දී, කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ඇ) රු.262,199 ක් වටිනා රෝනියෝ යන්ත්‍රයක්, ඡායා පිටපත් යන්ත්‍ර 02 ක් සහ වටිනාකම හදුනා නොගත් ජෙනරේටරයක් වර්ෂ 07 කට අධික කාලයක සිට නිෂ්ක්‍රියව පැවතුණි. | නිෂ්ක්‍රියව පවතින වත්කම් පිළිබඳ අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. | රෝනියෝ යන්ත්‍රය හා ඡායා පිටපත් යන්ත්‍ර 02 ක ඉදිරියේ දී වෙන්දේසි කිරීමට කටයුතු කරන බවත්, යතුරු ලියනය භාවියතට ගන්නා බවත්, ජෙනරේටරය අලුත්වැඩියාව සඳහා යොමු කර ඇති බවත් දන්වමි. |

3.5.5 <u>වාහන උපයෝජනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන සඳහා නිසි අධීක්ෂණයකින් තොරව රියැදුරු විසින් ඉන්ධන ලබා ගැනීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි. | ඉන්ධන ලබා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රමානුකූලව සිදු කළ යුතු වේ. | අධීක්ෂණ නිලධාරීයෙකුගේ අධීක්ෂණය යටතේ කටයුතු කිරීමට වැඩපිළිවෙලක් සකස් කර ඇත. |

3.6 <u>හඳුනාගත් අලාභ</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුස්සැල්ලාව වෙළඳ පොලේ බදු දී තිබූ කඩ කාමරවලට අදාළ ජල හා විදුලි බිල්පත් ලෙස රු.50,881 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | බදු කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතු වේ. | මෙසේ ගෙවා ඇති ජල ගාස්තු කඩ හිමියන්ගෙන් අය කිරීමට කටයුතු කරමි. |

3.7 <u>ප්‍රසම්පාදනය</u>

<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස රු.32,777,803 ක් දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරි වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |